ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

කැලණිය අශෝකාරාම සිළුමිණි පදනම
(සංස්ථාගත කිරීමේ)

කැලණිය අශෝකාරාම සිළුමිණි පදනම සංස්ථාගත කිරීම
සඳහා වූ පනත් කෙටුම්පතකි.

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සිසිර ජයකොඩි මහතා විසින්
2017 පෙබරවාරි මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 ජනවාරි මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

[161 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

මිළ : රු. 8.00 යි.

කැලණිය අශෝකාරාම සිළුමිණි පදනම
(සංස්ථාගත කිරීමේ)

කැලණිය අශෝකාරාම සිළුමිණි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"කැලණිය අශෝකාරාම සිළුමිණි පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනමට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2017 අංක   දරන කැලණිය අශෝකාරාම සිළුමිණි පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කැලණිය අශෝකාරාම සිළුමිණි පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු ව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "කැලණිය අශෝකාරාම සිළුමිණි පදනම" හි දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කැලණිය අශෝකාරාම සිළුමිණි පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධවද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) හෙළ සංස්කෘතිකය වර්ධනය, ප්‍රතිපෝෂණය හා පවත්වා ගැනීම මෙන්ම ඉදිරි පරම්පරාවට දායාද කිරීමේ අටියෙන් වාර්ෂික පෙරහැර මංගල්‍යයක් පැවැත්වීම;

(ආ) බෞද්ධ ආගමික පුනර්ජීවනය ඇති කිරීමේ අටියෙන් ඌනතා සහිත දුෂ්කර ප්‍රදේශයන්හි වෙහෙර විහාර නගාසිටුවීමට කටයුතු සැලැස්වීම;

(ඇ) අඩු ආදයම් ලාභී පාසල් හා විශ්වවිද්‍යාල දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා පොත්පත් හා ශිෂ්‍යාධාර පරිත්‍යාග කිරීම මෙන්ම ඒ අරමුණ සහිත ව්‍යාපෘති සකස් කිරීම;

(ඈ) ග්‍රාමීය මට්ටමේ පවත්නා සමිති සමාගම් වැඩි වර්ධනය කිරීම සඳහා විධිමත් මාර්ගෝපදේශනය අරමුණු කරගත් උපදේශන සේවාවක් හා ව්‍යාපෘති සැකසීම;

(ඉ) ස්වාභාවික මෙන්ම වෙනත් හදිසි ආපද තත්ත්වයන් හි දී අගතියට පත් හා අවතැන්වන සුවහසක් ජනයාට පිහිටවීම, සහන සැලසීමේ වැඩ පිළිවෙලක් "සිළුමිණ යාත්‍රා" නමින් ක්‍රියාවට නැංවීම;

(ඊ) දහම් පාසල් අධ්‍යාපනයත් පිරිවෙන් අධ්‍යාපනයත් ඒ හා පහසුකම් වැඩි දියුණු කිරීමේ විවිධ ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ව්‍යාපෘතීන් සංවිධානය කිරීම;

(උ) ගිහි පැවිදි සිව්වනක් පිරිසගේ ධර්ම ඥනය හා දහම් දැනුම වර්ධනය කරමින් ධර්ම පිපාසය සංසිඳුවීම අරමුණු කරගත් ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් විවිධ වැඩසටහන්, සම්මන්ත්‍රණ, දේශන ආදී ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම, දුප්පත් අසරණ ජනතාවට බොදු පුවත් සකස් කර දීම;

(ඌ) සීල ව්‍යාපාරය වැඩි වර්ධනය කිරීමේ අරමුණින් ඊට සම්බන්ධ වන උවැසි උවැසියන්ට ද, දහම් අධ්‍යාපනය වැඩි වර්ධනය කිරීමේ අරමුණින් දහම් පාසලට සම්බන්ධ වන දුවා දරුවන්ට සිල් රෙදි හා පොත් පත්, නිල ඇඳුම් රෙදි පරිත්‍යාග කිරීමේ ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් ආරම්භ කිරීම;

(එ) පවුල් සංස්ථාව තුළ පවතින බාහිර හා අභ්‍යන්තරික ගැටලු නිසා මානසික පීඩාවට ලක්ව සිටිනා පාර්ශ්වයන්ටත්, විවිධ සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික කරුණු හේතු කොට ගෙන මානසික ආතතීන්ගෙන් පෙළෙන පාර්ශ්වයන්ටත්, එම තත්ත්වයන්ගෙන් මිදීම හා නැවත යථාතත්ත්වයට පත්වීම සඳහා අවශ්‍ය විධිමත් හා වෘත්තීයමය මට්ටමේ උපදේශන සේවාවක් ආරම්භ කිරීම;

(ඒ) මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය වැඩසටහන් කරා යොමු කිරීමේ හා මත්ද්‍රව්‍ය නිවාරණය අරමුණු කරගත් දැනුවත් කිරීම් සහිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඔ) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ මානසික සෞඛ්‍ය නංවාලීම අරමුණු කරගත් විවිධ ඒකරාශිවීම් හා විවිධ වැඩසටහන් දියත් කිරීම;

(ඕ) රැකියා විරහිත තරුණ තරුණියන් රැකියාගත කිරීම සඳහාත් ඔවුනට ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහාත් අවශ්‍ය වන වෘත්තීය පුහුණුවීම් ලබාදෙන වෘත්තීය පුහුණු පාසලක් ආරම්භ කිරීම;

(ක) සමාන අරමුණු ඇති දේශීය හා විදේශීය ආයතන සමග සම්බන්ධතා හා අවබෝධතා ඇතිකර ගැනීම මෙන්ම අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ පොදු ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම;

(ග) පාසල් දූවා දරුවන්ට විෂය සමගාමී හා විෂායනුබද්ධ අධ්‍යාපනයක් ලබා දීමේ මධ්‍යස්ථානයක් හැටියට ක්‍රියාත්මක වීම; සහ

(ජ) ඉහත සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික වන්නා වූ හෝ හිතකර වන්නා වූ වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ දියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) අරමුදල් රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ආ) චංචල හෝ නිශ්චල දේපළ කවර හෝ ආකාරයකින් අත් කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදිකිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස්කම් කිරීම;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ නිකුත් කිරීමට සහ යම් බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම සහ ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන මුදල් කළමනාකරණ සභාව තීරණය කරන ආකාරයට ආයෝජනය කිරීම;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයක සංස්ථාගත කළ යම් තැනැත්තෙක්, හෝ පුද්ගල මණ්ඩලයක් සමග හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, මණ්ඩලයක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(ඊ) විවිධ සාමාජිකයන් වර්ගීකරණය කිරීම සඳහා ලියාපදිංචි වීමට ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම; සහ

(උ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කරනු ලබන තවත් සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මෙම පදනමේ සභාපති පදවියට ඉදිරි අනුප්‍රාප්තිකයා නම් කිරීමේ ඒකමතික අයිතිය කිසිදු බාධාවකින් තොරව තම නිල කාලය තුල වර්තමාන සභාපති හිමියන්ට හිමිවේ. එම නම් කිරීම නිල වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම තුල ප්‍රකාශයට පත් කිරීම මත නිල ප්‍රකාශයක් බවට බල ගැන්වේ;

(3) යම්කිසි හෙයකින් නම් කල අනුප්‍රාප්තික සභාපති වෙනස් කිරීමේ බලය හිමිවන්නේ නිල කාලය තුල වර්තමාන සභාපති හිමියන්ට, අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ සාමාජිකයන්ට එම නම් කිරීම ප්‍රශ්න කිරීමට හෝ එම අනුප්‍රාප්තික සභාපතිවරයාගේ නිල භාවය නොපිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නොහැක.

(4) සභාපතිවරයා මෙම පදනම කිසිදු දේශපාලනික අරමුණුගතව මෙහෙය නොවිය යුතු ය.

(5) පදනමේ සාමාජිකයන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය යම් විෂමාචාර ක්‍රියාවක් හෝ විනය විරෝධී කටයුත්තක් සිදුකර ඇතැයි චෝදනාවකට ලක් වූ විට ස්වාභාවික යුක්ති ධර්මයේ රීතීන්ට අනුකූලව විනය පරීක්ෂණයක් පවත්වා ඔහු හෝ ඇය නෙරපා හැරීම හා යම් අලාභයක් වෙතොත් එය අයකර ගැනීමේ බලය සභාපතිවරයාට නිල බලයෙන් හිමි වේ.

(6) සභාපති ධුරය නිලබලයෙන් අශෝකාරාම විහාරයේ විහාරාධිපති හිමිට හිමිවේ.

(7) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(8) සභාපතිවරයා හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු මියයාම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධුරය අත්හළහොත් මිස, අවුරුදු හතරක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. මියයාම හෝ ඉල්ලා අස්වීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, එම පුරප්පාඩුව පිරවීම සඳහා නව සාමාජිකයකු පත් කළ යුතු අතර, එම නව සාමාජිකයා අවුරුදු හතරක් ධුරය දැරිය යුතු ය.

සංස්ථාවේ

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද කළමනාකරණ මණ්ඩලය තෝරා පත්කර ගැනීම සඳහා සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්යය කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ කටයුතු කරගෙන යාම සඳහා සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ
අරමුදල.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දයක මුදල් හෝ ගාස්තු භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපළ කවර ස්ථානයකින් උපලබ්ධි වුව ද, මෙහි දක්වා ඇති පරිදි, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක්ම යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපළවලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

විගණනය හා ගිණුම්.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම සහ වත්කම් හා බැරකම් හා සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයෙකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් —

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ සභාපති හා ලේකම් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම තම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු ණය.

10. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින්, ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට පදනමට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසි චංචල සහ නිශ්චල දේප දැරිය හැකි බ

11. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක්, ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදදීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

13. සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. මේ පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හා බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.